# මනුෂ්‍යයන්ගේ මෙන් සතුන් තුළද හැඟීම් ක්‍රියාත්මක වෙයි ද?

**බොහෝ දෙනා තම නිවෙස්වල සුරතල් සතුන් ඇති කිරීමට කැමැත්තක් දක්වති. බල්ලන් පූසන් වැනි සතුන් අතීතයේ පටන්ම මිනිසා සමග සමීප ඇසුරක් පවත්වන සුරතලුන් අතර ප්‍රධාන තැනක් ගනී. මෙම සතුන් සිතාමතා කිසිවක් නොකරන බව බොහෝ දෙනා සිතා සිටින කරුණකි. නමුත් මෙසේ නිවෙස්වල සුරතලයට ඇති කරන සතුන් අතර පවා ඇතැම් අවස්ථාවලදී හැඟීම් සහිතව (EMOTIONS) ක්‍රියාවන් සිදුකරන බව පර්යේෂකයන් පිරිසක් විසින් අනාවරණය කොට ගෙන තිබේ.**



ඇමෙරිකාවේ ෂෝන් වැන් සිනේට් විසින් මෑතකදී මැක්ස් නැමැති බල්ලා පිළිබඳව අධ්‍යයනයක් සිදු කොට තිබේ. මැක්ස් වර්ගයේ බල්ලන්ට දැඩි ඉවක් මෙන්ම වෙඩි තැබූ කුරුල්ලන් හෝ සතුන් පවා සොයා ගෙන ඒමේ හැකියාවක් තිබේ. ෂෝන් දිනක් රෝගී අය සුවපත් වෙමින් සිටින නිවසකට ගිය අතර මැක්ස් එහි රෝද පුටුවක සිටි කාන්තාවක් ළඟින් වාඩි වී සිටියේය. මෙසේ රෝගී කාන්තාව සමග කථා බහ කරමින් සිටින අතර තුරේදී ඇය ඔහුගේ හිස කිහිප වතාවක් අත ගෑවාය.

විශේෂයෙන් මෙම සුරතල් සතුන් ඇති කරන අයිතිකරුවන් ඉතා දිගු කලක පටන් කරන ලද අධ්‍යනයකදී මෙසේ සුරතල් සතුන් ඔවුන්ගේ සගයන් පවා සෙනෙහස දක්වන ආකාරය දැක ගත හැකි වී තිබේ. සුරතල් සතුන් අයිතිව සිටින සෑම කෙනෙක්ම තම සුරතලා පිළිබඳව අඩුම තරමින් එක් කතාවක්වත් ප්‍රකාශ කොට තිබුණි. මේ සියලු කාරණාවලින් අනාවරණය වී තිබුනේ මනුෂ්‍යයන්ගේ මෙන් සතුන් තුළද හැඟීම් ක්‍රියාත්මක වීම සිදු වන බවයි. ජපානයේ ටෝකියෝ නුවර වෙසෙන මිචියෝ ටේක්මොටෝ සිය සුරතලා වන සුදු පැහැති බලු පැටියා (White Terrier වර්ගයේ) ගේ හැසිරීම් ඇතැම් අවස්ථාවලදී අධ්‍යයනය කොට තිබුණි. ඇය තම බලු පැටවා සිටින්නේ දුකින්ද, සතුටින්ද නැතිනම් කලබලකාරී හැඟීමකින්ද යන වග උගේ මුහුණ තුළින් බලා ගත හැකි බව ඇය පවසයි. මූක් සතුටින් සිටින අවස්ථාවලදී එහෙ මෙහෙ ඇවිදින්නටත් මූක්ගේ යහළු වන් අතරේ සහ අනෙක් බල්ලන් අතරේ ඇවිදීම සිදුකරන බව මිචියෝ පවසයි.

ප්‍රංශයේ පැරිස් නුවර වෙසෙන ගෝඩ්ෆෝරී ක්ලෙයාර් ඔහුගේ සුරතල් පූසා සම්බන්ධයෙන් ද මේ ආකාරයේ කරුණු රැසක් අනාවරණය කොට ගෙන තිබේ. ක්ලෙයාර් නිතරම තම පෙම්වතිය වන අලිසොන් සමග සිටින අවස්ථාවලදී ඔහුගේ පූසා වන ෂාකන් (Sharkan) විසින් නොල් පෙරලන්න. දත් තියවන්න පටන් ගන්නවා. ක්ලෙයර් සමග අලිසොන් සිටිනවාට ෂාකන් කැමති නැති බව පෙන්වීමට මෙසේ සිදු කොට තිබේ. ක්ලෙයර්ට වම් පසින් අලිසොන් සිටින විට හෝ දෙදෙනා තනිවම සිටින විට ෂාකන් මෙසේ සිදු කරන බව ක්ලෙයර් පවසයි. එක්දිනක් මෙම යුවල ෂාකන් ඉදිරිපිටදී දෙදෙනා සිප ගෙන තිබේ. එවිට ෂාකන් අලිසොන් ගේ අත්බෑගයට මුත්‍රා කොට තිබුණි. මේ නිසා ක්ලෙයර් අලිසොන් සමග අලුත් නිවසට යන විට ෂාකන් ටද යහළු පූසෙක් සොයා ගන්නා ලදී.

මීළඟට ඇමෙරිකාවේ ෂෝන් වැන් සිනේට් විසින් මෑතකදී මැක්ස් නැමැති බල්ලා පිළිබඳව අධ්‍යයනයක් සිදු කොට තිබේ. මැක්ස් වර්ගයේ බල්ලන්ට දැඩි ඉවක් මෙන්ම වෙඩි තැබූ කුරුල්ලන් හෝ සතුන් පවා සොයා ගෙන ඒමේ හැකියාවක් තිබේ.

ෂෝන් දිනක් රෝගී අය සුවපත් වෙමින් සිටින නිවසකට ගිය අතර මැක්ස් එහි රෝද පුටුවක සිටි කාන්තාවක් ළඟින් වාඩි වී සිටියේය. මෙසේ රෝගී කාන්තාව සමග කථා බහ කරමින් සිටින අතර තුරේදී ඇය ඔහුගේ හිස කිහිප වතාවක් අත ගෑවාය. මෙම වයස්ගත කාන්තාව මෙසේ සිටින අතරතුර ඇය හැරෙන්නට යාමත් සමග පුටුවෙන් පෙරළී පිටතට වැටුණි. ඒ අවස්ථාවේ සිනේට් විසින් ඇය දිගා කරමින් තිබුනේ මැක්ස් ගේ වලිගය මතයි.


නමුත් මැක්ස් එවිට උරණ වුනේ නැත. එහිදී මැක්ස්ට පැහැදිලිවම වේදනාවක් දැනිල තියෙනවා. එම අවස්ථාවේ ඇයට විශේෂ අවශ්‍යතාව පෙනුන නිසා එසේ සිදු කර තිබුණි. වැන් සිනේට් කැලිෆෝනියාවේ රැන්චෝ සෙන්ට් ෂිහි වුඩ්වෝඩ් සත්ව ආයතනයේ සත්තිවේදන අධ්‍යක්ෂවරයාය.


(Communication Director for the Helen Woodward Animal Center in Rancho Santa Fe, California)ඔහු පවසන ආකාරයට සිව්පා සතුන් තුළ පවා හැඟීම් ක්‍රියාත්මක වන බව හෙළි වී තිබේ. ඒ වගේම සමහර විද්‍යාඥයන් සතුන්ට හැඟීම් නොමැත කියා තර්ක කරන්නේ කෙසේද යන්න මහා පටලැවිල්ලක් බව ඔහු තවදුරටත් පවසා සිටී. බොහෝ අවස්ථාවලදී සතුන් බොහෝ ක්‍රියාවන්ට ප්‍රතිචාර දක්වන්නට පෙළඹී සිටිති. බොහෝ විට අවිද්‍යමාන යන්ත්‍රයකින් ක්‍රියාත්මක වන බලවේගයක් ආකාරයෙනි. එය ඉබේටම සතුන් විසින් සිදු කරති. "අපි හුදෙක් ආහාරයට මුල් වුනාතම් ඇත්තෙන්ම මැක්ස්ගේ ප්‍රතිචාරය විවිධාකාර වෙන්න තිබුණු බව" ඔහු පවසා තිබුණි. සතුන්ට හැඟීම් නොමැති බවට තර්ක කරන මෙම විද්‍යාඥයන් තව බොහෝ දේවල් අනාවරණය කොටගෙන නොතිබුණි. ඔවුන්ගේ පූසන් ඔවුන්ගේ කකුල් පිස දමන එක ඔවුන්ට නැවැත්වීමට නුපුළුවන. ඒ වගේම මිනිසුන් වැඩ නිමවී එන විට අයිතිවාසිකම ප්‍රකාශ කිරීම විනාශ කිරීමට ද ඔවුන්ට නොහැකිය. මෙම සතුන් අචාර කිරීමට වෙලාවක් ගන්නේ නැත. නිවසට ගොඩවන විටදී සිය වලිගය වැනීමෙන් ඒ බැව් ප්‍රකාශ කරති.

පසුගිය දශකයන් තුළදී මනෝවිද්‍යාඥයන් නිවෙස් වල ඇති කරන සුරතල් සතුන් ඔවුන්ගේ ස්වාමියන්ට ආදරය කරන්න පුළුවන් බව යම් පමණකට විශ්වාස කොට තිබේ. මෙම සතුන් ඉතා ඉක්මනින් හැඟීම් ක්‍රියා කිරීමට පෙළඹෙන බවත් ඒවාට ප්‍රතිචාර දක්වන බව පිළිබඳවත් මෙම විද්‍යාඥයන් තර්ක කොට තිබේ. එහිදී සතුන්ගේ සිරුරේ ක්‍රියාත්මක වන හෝමෝන නොසැලකිලිමත්ව කොකා ගැස්වූ තුවක්කුවක් මෙන් සිදුවන්නේ යැයි සඳහන් කොට තිබේ.

නමුත් එකම වර්ගයට අයත් ගතිගුණ ඇති අය තාක්ෂණික භාෂාව මගින් පිටතදී උනන්දුවක් ප්‍රබෝධයක් ඇති කර ගන්නා බවද සඳහන් කරති. නමුත් මෙකී දැක්ම වෙනස්වන අවස්ථාවන්ද ඇත. මෙහිදී පර්යේෂකයන් මෙම ක්ෂේත්‍රය තුළ වඩා දුර පැතිරී ගිය ස්නායු ජීව විද්‍යාත්මක හා මානවවයඃ පරීක්ෂණ වල නිරත වීමෙන්







අවශ්‍ය සුදුසු වෙලාවන් වලදී වඩා වැඩියෙන් සුරතලුන් අයිතිකරුවන් සතුන්ගේ ලොම් සහ පිහාටු ඔවුන් තුළ හැඟීම් ක්‍රියා කරවීමට සහාය වන බව හඳුනාගෙන තිබේ." මිනිසුන් විසින් ළමයින්ව පසුගාමී කරමින් සිටිනවා.

කරුණු අනාවරණය කොට ගෙන තිබේ.

තවත් අලුත් කරුණු සොයා ගනිමින් තවදුරටත් විම්පත්සියන් වෙනත් සුරතල් සතුන් පිළිබඳව මෙහිදී අධ්‍යනය කොට තිබේ. විද්‍යාව ආරම්භවීමත් සමග සුරතල් සතුන්ගේ අයිතිකරුවෝ එම සතුන් කරන්නේ මොනවාද යන්න අල්ලා ගන්න උත්සාහ කළහ. සතුන්ගෙන් ලද අත්දැකීම් අනුව ඔවුන් තුළ වූ අල්බැස ගත් බොහෝ දේ අනුමාන වශයෙන් සොයා ගැනීමට මෙහිදී හැකි වී තිබේ. විශේෂයෙන් සතුන් සමූහ වශයෙන් එහා මෙහා යැම් වලදී මුල් බැස ගත් හැඟීම් ලෙස සතුට ඊර්ෂ්‍යාව, ශෝකය, භය වගේම වඩා වැදගත්ම දෙයක් වන ආදරය යනාදිය පෙන්නුම් කෙරෙන බව හඳුනාගෙන තිබේ.මේ සම්බන්ධයෙන් විද්‍යාඥයන්ට පර්යේෂකයන් විසින් මග පෙන්වීම සිදු කොට තිබේ. මේ සඳහා ටිකක් පර්යේෂකයන් අකමැති වී සිටිති. මන්ද පර්යේෂකයන්ට පෙර විද්‍යාඥයන් ඉදිරියට යන නිසාය. මේ නිසා විද්‍යාඥයන්ට අලුත් ගමනකට තොරතුරු ශක්තිමත් කරුණු ඇත්ත වශයෙන්ම අනාවරණය කොට දී තිබේ.

"අවුරුදු පහක් ගියපසු මගේ සගයන්ට හිතන්න පුළුවන් වෙලා තියෙනවා මම මගේ පැද්දෙමින් සිටි ලීයෙන් (Rocker)නිදහස් වෙනව" කියල. මැක් බිකෝෆ් නැමැති ජීව විද්‍යාඥයා මෙහිදී පවසා තිබේ. නමුත් මෙසේ විද්‍යාඥයන් විසින් මෙහි අවසාන අවස්ථාවේ දී සතුන්ගේ හැඟීම් පිළිබඳව ප්‍රසිද්ධියේ කතා කිරීමට පටන්ගෙන තිබෙන බව පෙනේ. එය ඔවුන්ගේ රහසක් පිටනට එකතු කරනවා වගේ දෙයකි.

අවශ්‍ය සුදුසු වෙලාවන් වලදී වඩා වැඩියෙන් සුරතලුන් අයිතිකරුවන් සතුන්ගේ ලොම් සහ පිහාටු ඔවුන් තුළ හැඟීම් ක්‍රියා කරවීමට සහාය වන බව හඳුනාගෙන තිබේ." මිනිසුන් විසින් ළමයින්ව පසුගාමී කරමින් සිටිනවා. නමුත් ඔවුන් තවමත් අවශ්‍යයයි. අර වගේ සම්බන්ධතා විශේෂයෙන් සෙනෙහස" මේ බැව් පවසන්නේ ටැමර් ජීලර් (Tamar Geller) විසිනි. ඔහු කැලිෆෝනියාවේ ලොස් ඇන්ජලීස් නුවර (Loved Dog Company ආයතනයේ අයිතිකරුවාය. බොහෝ ජනසංඛ්‍යාවක් අමතමින් ඇය පැවසුවේ සුරතල් සතුන් ආරක්ෂා කිරීමෙන් කෙනෙකු කුඩා ළමයෙක් වශයෙන් වුවද තබාගත හැකි බවය. එහිදී සතුන්ගේ ක්‍රියාකාරකම් විස්තර කරනු ලැබුවේ ඉතාමත් විනෝදයෙනි. යම් දෙයක් සොයා ගැනීමට සතුන් තල්ලුකර විටදී සුරතල් සතුන් හා අනෙක් සිව්පාවුන් හිතමින් සිටිනවා. කවුරු හෝ ඔවුන්ට සෙනෙහස දක්වාවි කියල. ඔබත් සම්පූර්ණ වසරක් සිව්පාසතුන්ට සෙනෙහස දක්වා බලන්න. ඔවුන් ලස්සනට හිතන්නෙ නැද්ද බලන්න. එය නිශ්පල කාරණයක් නොවන බව ටැමර් විස්තර කළාය.

චාල්ස් ඩාවින් ගෙන් ඉවතට ගොඩක් සිව්පාසතුන්ගේ පැටව් චර්යා රටාවන් අතීතයේ දී විශ්වාස කළ පරිදි එම සතුන් කරන දේවල් සම්බන්ධයෙන් කිසිදු හැඟීමක් නොතිබුණ බව විශ්වාස කරති. ඉහළ වසරවල් වල පැරණි දෘෂ්ඨීය තුළත් මෙය දැඩි කොට විශ්වාස කොට තිබේ.

ජේන් ගුඩ්ඕල් විසින් කුඩා විද්‍යාත්මක පුහුණුවක් හාදරා සිටින්නියක්. ඇය නිතර කියාදීමෙන් හිතට කාවද්දන දෙයක් චර්යා සිද්ධාන්තයක් ලෙස ප්‍රගුණ කොට තිබුණේ නැහැ. නමුත් "මම බොහෝදෙනා භයට හා විශ්මයට පත් කරන දේවල් මගේ ජීවිතේ දී කළා" ඇය පවසයි.

ඒ කියන්නෙ රස්ටි නැමැති බලු පැටවෙක් ගැන ඇය මෙසේ පැවසුවාය. කුඩා කළු පාට ඇති කලවම් (Mongrel) වර්ගයේ බලුපැටවෙකු වූ රස්ටි ළමා කාලයේ දී ජීවත් වුනේ හෝටලයක් අසලය.

" සැම අවස්ථාවකම මේ බල්ලා මා සමග සැම තැනකම ඇවිදිනවා. නමුත් ඔහු මට අයිති කෙනෙක් නෙමෙයි. ඇය පැවසුවාය. හෝටලට අසලදී නම් මේ සතා කීකරුව සිටින්නේ නැත.

තමුත් උගේ ලස්සන හැසිරීම මෙන්ම සංවේදී කම මා සමග සිටින විට වැඩිසි. ඇත්තෙන්ම මේ නිසා මම හිතනවා සිව්පා සතුන් තුළත් හැඟීම් තියෙනව කියල. එනම් කෙනෙකුගේ සිත තේරුම් අරගෙන ක්‍රියා කිරීමේ හැකියාවක් තියෙනවා. කොහොමද අපි එහෙම නෑ කියන්නේ ගුඩ්ඕල් තවදුරටත් පැවසුවාය.

ගුඩ්ඕල් විසින් අප්‍රිකානු වනයකදී පසුව විද්‍යාත්මක පුහුණුවක් ලබා ගත්තාය. එහිදී ඇය චිම්පන්සින්ගේ නම් වෙනුවට සංඛ්‍යාවක් යොද ගත්තා. ඔවුන්ගේ හැසිරීම් රටාව සමග වදන් වලින් විස්තර කරනු ලැබුවාය.Joy(ප්‍රීතිය)depression(පහත්වීම)grief(ශෝකය / දුක) කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයේ ආචාර්යවරයෙකු විසින් එම සතුන්ගේ ඇස් පිළිබඳව අධ්‍යනය කොට තිබුණි. නමුත් ඇය විසින් අධ්‍යයන කරන ලද දේවල් කිසිවිටෙකත් බිඳහෙළිය නොහැකි විය. පර්යේෂකයන් විසින් ගුඩ්ඕල්ගේ උරුමය තවදුරටත් සොයා ගැනීමත් සමග චිම්පන්සීන් ඉක්මවා බල්ලන් පූසන්ට

අතීතයේ පටන්ම බල්ලා මිනිසාගේ ඉතා සමීප මිත්‍රයෙකි. මෑතකදී කරන ලද අධ්‍යනයකින් පෙනී ගොස් තිබුනේ බල්ලන්ට පවා වැඩියෙන් චිම්පන්සීන් විසින් මනාව හැඟීම් වල සංඥවන් වටහා ගන්නා බවයි. සැමුවෙල් ගෝසින් ජීව විද්‍යාඥයෙකි. ඔස්ටින් වල ටෙක්සාෆ් විශ්ව විද්‍යාලයේ සිටින ඔහු පවසන ආකාරයට මිනිසුන්ට පුළුවන් ආකාරයේ වර්ගයන් හතරක් බල්ලන්ට ද පෞද්ගලිකව කිරීම කළ හැකි බවයි.

කුරුල්ලන්ට මීයන්ට සහ අනෙක් සිව්පාවුන්ට විතරක් නොව කුඩා බූවල්ලෙකු වැනි සතුන්ට පවා කරුණාව, ත්‍රාසය වැනි දේවල් දැක්වීමේ හැකියාව තිබෙන බව අනාවරණය වුණා. මේ සඳහා ඔවුන්ගේ මොළයේ තිබෙන කොට්ටම්බා ගෙඩියක් වැනි ඉන්ද්‍රියක් උපකාරී වන බව පැවසේ.

බොහෝ සිව්පාවුන් යම් යම් දේවල් සම්බන්ධයෙන් සමාන ජාතියට අයත් අය අතරේ ආදරය වැනි හැඟීම් වැඩි වශයෙන් දැනෙන බව සඳහන් වේ. චිම්පන්සියන් සමහර වෙලාවට ඔවුන්ගේ ජාතියට සම්බන්ධ නොවුනත් ළඳරු හැඩය ඇති Chimps වර්ගයේ පැටවුන් පවා සෙනෙහසින් රැක බලා ගන්නේ ඒ නිසා බැව් සඳහන්ය.

ඒවගේම අශ්වයන් පවා ඔවුන්ගේ ගාලෙහි බැම්ම හොඳින් දන්නා නිසා වෙනත් පට්ටි වල රාත්‍රිය ගත කිරීම ප්‍රතික්ෂේප කරනු ලබයි. සතුන් අතර තල්මසුන් මිනිසුන්ට සමානව ඉතාමත් ප්‍රසංගාත්මක විශේෂ නැටුම් ඉදිරිපත් කරනු ලබනවා.මේ අනුව මිනිසුන් මෙන් සිව්පාවුන් විසින් ද මෙලෙස විවිධ හැඟීම් ප්‍රකාශ කරන බැව් පර්යේෂකයන් පෙන්වා දී තිබේ. මේවා බොහොමයක් ඉතා සංකීර්ණය.

අතීතයේ පටන්ම බල්ලා මිනිසාගේ ඉතා සමීප මිත්‍රයෙකි. මෑතකදී කරන ලද අධ්‍යනයකින් පෙනී ගොස් තිබුනේ බල්ලන්ට පවා වැඩියෙන් චිම්පන්සීන් විසින් මනාව හැඟීම් වල සංඥවන් වටහා ගන්නා බවයි.

සැමුවෙල් ගෝසින් ජීව විද්‍යාඥයෙකි. ඔස්ටින් වල ටෙක්සාෆ් විශ්ව විද්‍යාලයේ සිටින ඔහු පවසන ආකාරයට මිනිසුන්ට පුළුවන් ආකාරයේ වර්ගයන් හතරක් බල්ලන්ට ද පෞද්ගලිකව කිරීම කළ හැකි බවයි. සමාජශීලීත්වය සෙනෙහස දැක්වීම, හැඟීම් වල ස්ථිරභාවය හා දක්‍ෂභාවය යන මේවාය. මේවාට අනුව සිය හැඟීම් බල්ලන් මෙහෙය වන බව මනෝවිද්‍යාවන්ට අදාළ පරීක්ෂණ මගින් අනාවරණය කොට ගෙන තිබේ. මෙම සුරතලයට ඇති කරන සතුන් සඳහා අයිතිකරුවන් සිටීම අත්‍යවශ්‍යයයි. පැරිසියේ මෙඩෙලයින් තිස් විසින් ඇගේ පූසන් තිදෙනෙකුට සංග්‍රහ කළ ආකාරය ඇය සඳහන් කොට තිබුණි. හැරී, ස්පූකි සහ නිකීටා යන තිදෙනා ඇගේ සුරතලුන්ය. ඇය උන්ව නගරයේ තිබෙන ප්‍රධාන ආපන ශාලා සඳහා රැගෙන යති. එහිදී ඇය තම සුරතලුන්ට චීස් පිඟන්, ඕඩර් කළ විට පූසන්ට ද ඒවා ලබාදේ. පැරිසියේ තිබෙන අති සුඛෝපභෝගී Crillion හෝටලයේ දී මෙලෙස සුරතල් සතුන්ට ඕනෑවටත් වඩා ආවතේවකම් කරනු ලැබේ. එයට පැමිණෙන අය සමග සිටින සුරතල් සතුන් ඔවුන් සමග ඉතා හොඳින් හැසිරෙනවා. ආහාර ගන්නවා. බල්ලන් රංචු පිටින්ම සමහරු රැගෙන එනවා. එහිදී ආහාර ගැනීමට තිබෙන පත්‍රිකාව ශබ්ද නගා කියවමින් අවශ්‍ය දේවල් ලබා දෙනවා. සැන් ජුවෑන්, පියුරෝටෝ රිකෝ, ඩේවිඩ් කුර්ලෑන්ඩ් සහ ඔහුගේ පවුම් 224 වටිනා විශාල බල්ලාත් සමග ඔවුන් තාටාකයට එකට පැමිණෙති. එහිදී ඇතුලත්වන බල්ලන් සඳහා ද ඇතුල්වීමේ කාඩ් පත් ලබා ගත යුතුය. සතුන් ගේ පාද පිරිසිදු කොට පුයුර දමා ඔවුන් ද වතුරට බස්සවනු ලබනවා. චොකලට් සීනි මිශ්‍ර කර සාදන කෑම පවා බල්ලන්ට ලබා දෙනවා. රාත්‍රිය සඳහා විශේෂ ආහාර පත්‍රිකාවක් ලබාදෙනු ලැබේ. එහි අඩංගු වන ඕනෑම ආහාරයක් බල්ලන්ට ද ලබා ගත හැකිය. බල්ලන්ගේ තමන්ගේ භාජන තබාගෙන ආහාර ලබා ගන්නවා. මෙම අවස්ථාවලදී බල්ලන් පැමිණ සිටින අනෙක් අය දෙස මහත් උනන්දුවෙන් ලැදිකමෙන් තොරතුරු සොයන බවත් පර්යේෂකයන් සොයා ගෙන ඇත. විශේෂයෙන් බල්ලෙකු හා පූසෙකු ගේ හැසිරීමට නියමිත කාරණා මාර්ක් බ්වුසර් විසින් අනාවරණය කොට තිබුණි. ඔහු හාවඩ් හි ජීව විද්‍යාඥයෙකි. මිනිසුන්ගේ හැඟීම් සමග සතුන්ගේ හැඟීම් සන්සන්දනය කළ ඔහු සමහර විට වර්ණයන් වැනි දේවල් සන්සන්දනයේ දී එනම් කළු හා සුදු වර්ණ දැක්ම දෙගොල්ලන් තුළම ඇත්තේ එකම සංකල්පයක් බව සඳහන් කොට තිබුණි. මෙය ඉතා සංකීර්ණ ක්‍රියාවලියක් බව ද අනාවරණය කොට දී තිබුණි. බිකෝෆ්(Bekoff) විසින් මෑතක දී මේ හා සම්බන්ධ කරුණු කථා කරමින් සතුන්ගේ මනස තුළ ක්‍රියාත්මකවන හැඟීම් සම්බන්ධව(Minding Animals) කෘතියක් පිට කරනු ලැබුවේය. එහි දී බල්ලන්ගේ ප්‍රීතිය සහ මනුෂ්‍යයන්ගේ ප්‍රීතිය යම් අයිතිවාසිකමක් ලබා ගැනීමේදී එක හා සමාන බව අනාවරණය කොට

සතුන් ගේ පාද පිරිසිදු කොට පුයුර දමා ඔවුන් ද වතුරට බස්සවනු ලබනවා. චොකලට් සීනි මිශ්‍ර කර සාදන කෑම පවා බල්ලන්ට ලබා දෙනවා. රාත්‍රිය සඳහා විශේෂ ආහාර පත්‍රිකාවක් ලබාදෙනු ලැබේ. එහි අඩංගු වන ඕනෑම ආහාරයක් බල්ලන්ට ද ලබා ගත හැකිය. බල්ලන්ගේ තමන්ගේ භාජන තබාගෙන ආහාර ලබා ගන්නවා. මෙම අවස්ථාවලදී බල්ලන් පැමිණ සිටින අනෙක් අය දෙස මහත් උනන්දුවෙන් ලැදිකමෙන් තොරතුරු සොයන බවත් පර්යේෂකයන් සොයා ගෙන ඇත

ගෙන තිබේ. ඒ වගේම මෙම සුරතල් සතුන් ඔවුන්ගේ ස්වාමියන්ට (අයිතිකරුවන්ට) ඉතා ආදරයෙන් මහත් ගෞරවයෙන් සලකනු ලබති. ඔවුන් මිනිසුන්ගේ අතවැසියන් වගේ ඔවුන් සමග ම ජීවත් වන බව ජෝන් කැට්ස් පැවසීය. ඔහු බල්ලන්ගේ අලුත් ක්‍රියාවන් සම්බන්ධයෙන් (The New Work Of Dogos) නම් කෘතියේ කතුවරයාය.

සතුන් පිළිබඳ මනෝ විද්‍යාව තවමත් එළිදරව් වෙමින් පවතින විෂය ක්ෂේත්‍රයකි. විශේෂයෙන් යථාරූපී සිද්ධාන්ත සමග ස්නායු ජීව විද්‍යා තොරතුරු මේ සඳහා වැඩි වශයෙන් අවශ්‍යයයි. ඉතා සියුම්ව කරන ලද පරීක්ෂණවලදී පෙනී ගොස් ඇත්තේ ඇතැම්විට සතුන්ට මිනිසුන්ට සමාන මොළ ආකෘතීන් තිබෙන බවයි. ඒ නිසා මිනිසුන් විධියට සතුන් ද ඔවුන්ගේ හැසිරීම් අනුකරණය කරන බව සඳහන් වේ. ❑

(News Week ඇසුරිනි.)

අශෝකා විජේසේකර